**මහනුවර මහා නගර සභාව - 2020**
---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහනුවර මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කිය විය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මහා නගර සසභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1(අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වා දුන් 1.3.1(ආ), (ඇ), (ඈ) හා (ඊ) දරන ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන තුළ මෙම වැරදි නිවැරදි කළ යුතු වීම |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු වටිනාකම හා පොලී ආදායම පිළිවෙලින් රු.21,928,168 ක් හා රු.776,712 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියට ලැබිය යුතු පොලිය ණයගැතියන් ලෙස සටහන් කරන බවත්, ඉදිරියේ දී නිවැරදි කරන බවත් දන්වමි. | නිවැරදිව ගිණුම් තැබිය යුතු වීම |
| (ඇ) | පසුගිය වර්ෂ 03 තුළ රු.2,031,295,949 ක සංවර්ධන වියදම් දරා ඉදිකළ ගොඩනැගිලි 27 ක් හා ඊට පෙර වර්ෂයේ ඉදිකළ ගොඩනැගිලි 201 ක් නැවත තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කිරීමට කටයුතු කරන බව දන්වමි. | තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වීම |
| (ඈ) | බැංකු සැසැඳුම් ප්‍රකාශනවල සෘජු බැර හා සෘජු හර ලෙස පෙන්වන එකතුව රු.40,195,822 ක් වූ අගයට අදාළ ගනුදෙනු හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පරීක්ෂා කර, ඉදිරි කටයුතු කරන බව දන්වමි. | සෘජු බැර හා සෘජු හර හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වීම |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 08 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව, ශේෂය හා උපලේඛන වාර්තා අනුව ශේෂය අතර රු.383,427,924 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේ දී පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | උපයෝගී ලේඛන නිවැරදිව පිළියෙල කළ යුතු වීම |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් විෂයයන් 04 කට අදාළ එකතුව රු.202,844,384 ක් සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා, තොග උපලේඛන හා කේවළ ශේෂ ආදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී, සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී මෙවැනි ප්‍රමාදයන් සිදු නොවීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වමි. | අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වීම |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | මහා නගර සභා ආඥා පනත | | | |
| (i) | 127(3) වගන්තිය | අනුකූලතා සහතික ලබා නොගෙන පදිංචි වීම මත ව්‍යාපාරික ඒකක 10 කින් 2018 වර්ෂයේ සිට අය කළ යුතු රු.1,878,500 ක දඩ මුදල් අය කර නොතිබුණි. | උපදෙස් ඉල්ලා පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් යොමු කර ඇති බව දන්වමි. | මහා නගර සභා ආඥා පනතේ වගන්ති ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම |
| (ii) | අංක 272 – 6(ඇ) අධිකාරිය ප්‍රකාරව, 2002 අගෝස්තු 09 දිනැති මහනුවර මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ IV වන කොටස (01) ඡේදය | බලපත්‍ර ලබා ගැනීමකින් තොරව නිත්තවෙල ක්‍රීඩාංගණය තුළ රු.2,567,440 ක ගාස්තු අයවිය යුතු දැන්වීම් පුවරු 43 ක් ප්‍රදර්ශනය කර තිබුණි. | ආදායම් වියදම් කාරක සභාවේ දී මේ පිළිබඳ තීරණයක් ගන්නා බව දන්වමි. | අතුරු ව්‍යවස්ථා මාලාව අනුව ක්‍රියා කළ යුතු වීම |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය | සේවය අවසන් කරන ලද හා විශ්‍රාම ගිය සේවකයින් 05 දෙනෙකුගෙන් අය විය යුතු රු.535,848 ක ණය අය කිරීමට හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 332 ට අදාළ රු.8,670,215 ක ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී, ණය අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.615,809,729 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.609,888,349 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

---------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | එක් ඒකකයකින් රු.100,000 ක් ඉක්ම වූ ඒකක 156 කින් අය විය යුතු එකතුව රු.36,768,082 ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.256,537,585 ක වරිපනම් බදු අය කර නොතිබුණි. | හිඟ අය කර ගැනීම සඳහා ලිපි යැවීම, ක්ෂේත්‍රයට යාම, ප්‍රචාරණ කටයුතු කිරීම ආදිය සිදු කරන බව දන්වමි. | අය විය යුතු ආදායම් රැස් කර ගත යුතු වීම |
| (ආ) | ඉඩම් හා ජල බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ඉඩම් හා ජල බදු පිළිවෙලින් රු.27,821,517 ක් හා රු.132,393,876 ක් අය කර නොතිබුණි. | ඉඩම් හා ජල බදු කොටසක් අය වී ඇති අතර, ජල විසන්ධි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව දන්වමි. | අය විය යුතු ආදායම් රැස් කර ගත යුතු වීම |
| (ඇ) | කඩ කුලී | | |
| (i) | 2019 වර්ෂයේ සිට වෙළඳ පොළවල් බදු දීම මගින් හා කඩ කාමර සඳහා ටෙන්ඩර් ගාස්තු ලෙස අය විය යුතු රු.70,029,564 ක අය කර නොතිබුණි. | නව තක්සේරුව මත හා කොවිඩ් වසංගත තත්ත්වය මත සංචරණ සීමා, ඇඳිරි නීතිය පැනවීම නිසා, හිඟය වර්ධනය වී ඇති බව දන්වමි. | අය විය යුතු ආදායම් රැස් කර ගත යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (ii) | 2019 වර්ෂයේ සිට මැණික්කුඹුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා ලැබිය යුතු රු.21,768,049 ක කඩ කුලී අය කර නොතිබුණි. | අය කිරීම් සම්බන්ධයෙන් මහනුවර මහාධිකරණයේ රීට් අංක 14/9 දරන නඩුව විභාග වන අතර, ඉදිරියේ දී නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. | අය විය යුතු ආදායම් රැස් කර ගත යුතු වීම |
| (ඇ) | වෙළඳ අයිතිය බදු දීම<br>------------------------ | | |
| (i) | පේරාදෙණිය තානායම බදු දීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය මඟින්, මහා නගර සභාවට අය විය යුතු එකතුව රු.8,132,601 ක කුලී මුදල් අය කර නොතිබුණි. | රාජ්‍ය ආයතනයක් බැවින්, තානායම් කළමනාකරු සමඟ සාකච්ඡා කර, ගැටළු විසඳා ගැනීමට නියමිත බව දන්වමි. | අය විය යුතු ආදායම් රැස් කර ගත යුතු වීම |
| (ii) | මැණික්කුඹුර සිල්ලර වෙළඳ සංකීර්ණය<br>--------------------------------------------- | | |
| | 2000 වර්ෂයේ රු.60,992,475 ක් වැය කර ඉදිකරන ලද මැණික්කුඹුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් ගිවිසුම්ගත වීමකින් තොරව බදු දී තිබූ අතර, වර්තමානය වන විට සියලු කඩ කාමර සඳහා නව තක්සේරු මත නව ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ගිවිසුම්ගත වන ලෙස බදුකරුවන්ට දන්වා ඇති බව දන්වමි. | නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු වීම |
| (ඉ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>------------------------------ | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.145,535,036 ක් අය කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්වරයාට උපලේඛන යොමු කිරීමෙන් පසු මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු ආදායම් අය කළ යුතු වීම |
| (ඊ) | වෙනත් ආදායම්<br>------------------ | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට රථ ගාල බදු දීම, වීථි බදු දීම හා දැන්වීම් පුවරු සඳහා, පිළිවෙලින් අය විය යුතු රු.200,567,833 ක්, රු.12,705,571 ක් හා රු.34,935,818 ක් අය කර නොතිබුණි. | මෙම හිඟ දඩ මුදල් අය කර ගැනීම සඳහා මහනුවර මහාධිකරණයේ නඩු විභාග වෙමින් පවතින බව දන්වමි. | අය විය යුතු ආදායම් රැස් කර ගත යුතු වීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරිම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොහාගොඩ සම්පත් පියස හා ප්ලාස්ටික් ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානයේ පැවති භෞතික තොගය හා අදාළ ලේඛන 2020 අගෝස්තු 21 වන දින පරීක්ෂාවේ දී, රු.1,478,444 ක විකුණුම් වටිනාකමින් යුත් ප්ලාස්ටික් කැට කි.ග්‍රෑ.18,955 ක හා රු.1,192,312 ක වටිනාකමින් යුත් කාඩ් බෝඩ් කි. ග්‍රෑ.95,385 ක ඌනතාවයක් පැවතුණි. | සටහන් තැබීමේ දී, ප්‍රමාද දෝෂයක් සිදු වී ඇති බව හා මෙය පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කර ඇති බව දන්වමි. | නිවැරදිව පොත්පත් නඩත්තුව හා වෙනත් නිලධාරියෙකු පොත්පත් අධීක්ෂණය කළ යුතු වීම |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය නොවී වසර 05 කට අධික කාලයක් ඉක්මවා තිබූ දැන්වීම් පුවරු ගාස්තු හා අනතුරට පත් වාහනවලට අදාළව ලැබිය යුතු රු.13,306,602 ක් අය කිරීමට හා අවුරුදු 01 සිට 05 අතර කාල පරාසයක් ගත වී ඇති රු.109,495,156 ක කුලී, ඉඩම් බදු හා රථ වාහන ගාස්තු අය කිරීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | කඩිනමින් පිළිතුරු සැපයීමට කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු ශේෂ අය කළ යුතු වීම |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 05 ට අධික කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.50,443,103 ක නොගෙවූ වැටුප් හා වේතන, සැපයුම් ණයහිමි හා විදුලිය පවරා ගැනීමේ දී, ඇති වූ ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වීම |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ ඩිජිටල් දැන්වීම් පුවරු 03 ක් සඳහා 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල සඳහා අය විය යුතු රු.988,358 ක් අය කර ගැනීම සඳහා නීති ක්‍රියාමාර්ග ගෙන ඇති නමුත්, අය කිරීම් සිදු කර නොතිබුණි. | පුවරු ගලවා ඉවත් කිරීමට හා විදුලිය විසන්ධි කිරීමට ඉංජිනේරු දැනුවත් කර ඇති අතර, අධිකරණ ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක වෙමින් පවතින බව දන්වමි. | ගාස්තු නොගෙවන දැන්වීම් පුවරු සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතු වීම |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දළදා වීදියේ පිහිටි අංක 74 ස්ථානයේ පිහිටි නාගරික ඉඩම බදු දීම | | |
| විධිමත් ටෙන්ඩර් පරිපාටියකින් හා නීත්‍යානුකූල ගිවිසුම්ගතවීමකින් තොරව 2007 වර්ෂයේ සිට බාහිර පාර්ශවයක් විසින් භුක්ති විඳින ඉහත සඳහන් නාගරික ඉඩමේ නොදියුණු තක්සේරු වටිනාකම රු.55,000,000 ක් ලෙස 2015 අගෝස්තු මස තක්සේරු කර ඇතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද කිසිදු මුදලක් අය කිරීමට හෝ සන්තකය පවරා ගැනීමට හෝ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හෝ සභාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නෛකිත කටයුතු සඳහා අවශ්‍ය ලියවිලි පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බව දන්වමි. | නීත්‍යානුකූල ක්‍රමවේදයකට අනුව, දේපළ බදු දිය යුතු වීම |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ග ඉදිකිරීමට අදාළ ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී, ඒ සඳහා නියමිත රේටයන් (HSR) භාවිතා කළ යුතු වුවත්, පූර්ව අනුමැතියකින් තොරව නියමිත රේටයන්ට වඩා අඩු රේටයන් භාවිතා කර ගම්පෙරළිය වැඩසටහන යටතේ කර්මාන්ත 06 ක් සඳහා රු.12,800,650 ක් අඩුවෙන් ඇස්තමේන්තු සකස් කර අදාළ ඉදිකිරීම් සිදු කර තිබුණි. | මෙම කර්මාන්ත 06 හැර, වෙනත් කර්මාන්ත 07 ක් මඟින් ලාභ උපයා ඇති බව දන්වමි. | කොන්ත්‍රාත් පිරිවැය හෝ ආවරණය වන ආකාරයට ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම |